PGIE
POST GRADUATE INSTITUTE OF ENGLISH

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්

2010

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

වාර්ෂික වාර්තාව සහ ගිණුම්

2010

අන්තර්ගතය

1. දැක්ම

2. මෙහෙවර

3. අධ්‍යක්ෂ සහ ජ්‍යෝෂ්ඨ කළමනාකරණය පිළිබඳ කෙටි විග්‍රහයක්

(අ) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සාමාජිකයෝ

(i) කළමනාකරණ මණ්ඩලය

(ii) දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලය

4. අධ්‍යක්ෂ සමාලෝචනය

(අ) කෙටි හැඳින්වීම

(ආ) ජයග්‍රහණයන්

(ඇ) අසමර්ථ්‍යයන් හා සනාත කිරීම

(ඈ) අනාගත සැලසුම්

5. අධ්‍යක්ෂ වාර්තාව

6. මූල්‍ය ප්‍රකාශන (නව සැකැසුම අනුව)

7. විගණන කමිටු වාර්තාව

8. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

10. විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු

1. දැක්ම

වෙනස්වන අවශ්‍යතාවලට මුහුණදීමට දිවයින පුරා වෘත්තීමය හා ශික්ෂණ විද්‍යාත්මක කුශලතා වර්ධනය කරමින් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ හා ඉංග්‍රීසි අධ්‍යාපනයේ අධ්‍යයන උත්කෘෂ්ටතාව සහ පර්යේෂණ පිළිබඳ කීර්තිමත් නායකයෙකු වීම.

2. මෙහෙවර

පාණ්ඩිත්‍යය හා පර්යේෂණ තුළින් ද ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ හා ඉංග්‍රීසි අධ්‍යාපනයේ ජාතික ප්‍රතිපත්ති වර්ධනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් බලපෑම් ඇතිකිරීම මඟින් හා ජාතික මට්ටමින් ඉංග්‍රීසි අධ්‍යාපනයට නව මෙහෙයවීමක් ලබාදීමෙන් ද පශ්චාද් උපාධි මට්ටමේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ හා ඉංග්‍රීසි අධ්‍යාපනයේ උත්කෘෂ්ටතාව සඳහා අවස්ථා සැලසීම හා ආධාර කිරීම.

3. අධ්‍යක්ෂ හා ජ්‍යෙෂ්ඨ කළමනාකරණය පිළිබඳ කෙටි විග්‍රහයක්



2010 වර්ෂය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ මූලාරම්භයේ සිට බලන කල සියලු පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය පුරප්පාඩුවකින් තොරව ක්‍රියාත්මක වූ වර්ෂයක් ලෙස සනිටුහන් කළ හැකිය. අධ්‍යයන කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් බලන කල කෙසේ හෝ කිසිදු බඳවා ගැනීමක් සිදු කිරීමට ආයතනය සමත් නොවීය. එහෙයින් අධ්‍යයන කටයුතු දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ ශාස්ත්‍රපති පාඨමාලාවට පමණක් සීමා විය.

(අ) (i) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෝ

	නම	තනතුර
1	මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතා	ඉංග්‍රීසි පිළිබඳ ස්ථාවර කමිටුවේ සභාපති
2	මහාචාර්ය ආර්. රහීම් මෙය	වැඩබලන අධ්‍යක්ෂ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
3	ආචාර්ය ජේ. මනතුංග මයා	අංශ ප්‍රධාන/ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ මධ්‍යස්ථානය, මොරටුව විශ්වවිද්‍යාලය
4	මහාචාර්ය එම්. පෙරේරා	අධ්‍යක්ෂ/කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, කොළඹ විශ්වවිද්‍යාලය (2010.02.28 දින තෙක්)
5	මහාචාර්ය ජී. ඩී. ලේකම්ගේ මිය	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සනාතන සභා නියෝජිත
6	මහාචාර්ය එස්. වෝල්ටර් පෙරේරා මයා	ඉංග්‍රීසි පිළිබඳ මහාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයනාංශය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
7	මහාචාර්ය නෙලුකා සිල්වා මෙය	අංශ ප්‍රධාන/ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය
8	ආචාර්ය ඩී. මෙන්ඩිස් මෙය	ඉංග්‍රීසි පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කොළඹ විශ්වවිද්‍යාලය
9	ආචාර්ය එස්. රමේෂ් මිය එස්. සුන්තරේස්වරන් මයා	අංශ ප්‍රධාන/වාග්විද්‍යා හා ඉංග්‍රීසි අධ්‍යයන අංශය, යාපනය විශ්වවිද්‍යාලය අංශ ප්‍රධාන/ඉංග්‍රීසි අධ්‍යයන අංශය, යාපනය විශ්වවිද්‍යාලය (2010.07.02 දින සිට)

	නම	තනතුර
10	බී.කේ.පී. අබේසූරිය මිය ආචාර්ය කේ. වර්ණපාල මිය දිලිනි දේවේන්ද්‍ර මිය	අංශප්‍රධාන/භාෂා අධ්‍යයනාංශය, විවෘත විශ්වවිද්‍යාලය (2010.06.31 දින දක්වා) වැඩ බලන අංශ ප්‍රධාන නීති අධ්‍යයනාංශය විවෘත විශ්වවිද්‍යාලය (2010.02.01 සිට 2010.09.30 දක්වා) අංශ ප්‍රධාන/භාෂා අධ්‍යයනාංශය විවෘත විශ්වවිද්‍යාලය (2010.10.01 සිට)
11	මාලිනී පීරිස් මිය ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මයා	ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය (2010.08.01 දින සිට)
12	ඒ. රණවීර මයා	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පාලක සභා නියෝජිත
13	සී. ද සිල්වා මයා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/සංඛ්‍යාන විද්‍යා හා පරිගණක විද්‍යා අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය
14	එස්. අටුගොඩ මයා	අධ්‍යක්ෂ/ඉංග්‍රීසි අධ්‍යයනාංශය, ජාතික අධ්‍යාපන ආයතනය
15	එල්.කේ. කුමාරතුංග මිය	දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලයේ නියෝජිත
16	දිලිනි වලිසුන්දර මෙය	අංශ ප්‍රධාන/ඉංග්‍රීසි අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය (2010.01.12 දින සිට)
17	එච්.එම්.එන්.එස්. ගුණවර්ධන මිය	අධ්‍යක්ෂ ජෙනරාල්, නීති කටයුතු දෙපාර්තමේන්තුව, මහාභාණ්ඩාගාරයේ නියෝජිත (2010.07.02 දින සිට ක්‍රියාත්මක වන පරිදි)

(2) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයෝ

	නම	තනතුර
1	මහාචාර්ය ආර්. රහීම් මෙය	සභාපති, වැඩබලන අධ්‍යක්ෂ/පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
2	මහාචාර්ය එස්. ප්‍රනාන්දු මෙය වී.වී. මැදවත්තේගෙදර මිය	ඉංග්‍රීසි අධ්‍යයනාංශය, කොළඹ විශ්වවිද්‍යාලය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
3	මහාචාර්ය එම්. ගුණසේකර මෙය	ඉංග්‍රීසි පිළිබඳ මහාචාර්ය, කැලණිය විශ්වවිද්‍යාලය
4	ආචාර්ය එච්. රත්වත්ත මිය	ඉංග්‍රීසි පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
5	ආචාර්ය ඩබ්. එම්. සෙනෙවිරත්න මිය	පුස්තකාලයාධිපති, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
6	ආචාර්ය දුෂ්‍යන්ති මෙන්ඩිස් මෙය ආචාර්ය රධිකා ද සිල්වා මෙය	ඉංග්‍රීසි පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ඉංග්‍රීසි අධ්‍යයන අංශය, කොළඹ විශ්ව විද්‍යාලය (2010.02.14 දින තෙක්) ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, භාෂා අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
7	එල්. කුමාරණතුංග මිය	බාහිර කථිකාචාර්ය, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
8	පී. නාගසුන්දරම් මෙය	බාහිර කථිකාචාර්ය, පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
9	අයි. එන්. ජේ. බෝගමුව මෙය	ශිෂ්‍ය නියෝජිත
10	එස්. ආර්. ඉලංගකෝන් මෙය	ශිෂ්‍ය නියෝජිත

4. අධ්‍යක්ෂ සමාලෝචනය

(අ) කෙටි හැඳින්වීම

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය 2006 වසරේ දී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ස්ථාපනය කරන ලද්දේ ගුරු අධ්‍යාපනය සහ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ජාතික ආයතනය ලෙස සේවය සැපයීමේ අභිලාශයෙනි.

එය ස්ථාපනය කරන ලද දින පටන් එම ආයතනයේ සංවර්ධනය කාර්ය මණ්ඩලයේ සහ ස්ථිර ගොඩනැගිල්ලක අඩුපාඩුව හේතුවෙන් දැඩි අපහසුතාවකින් ක්‍රියාත්මක විය. මීට අමතරව පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශිෂ්‍ය ක්‍රියාකාරිත්වය ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි අධ්‍යාපනය වසර දහයකට අධික කාලයක් මුළුල්ලේ නොමැතිවීම හේතුවෙන් දැඩි ලෙස පසුබෑමට හසු වී තිබුණි. 2009 වසරේ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ කිසිවෙකු නොවූ අතර අධ්‍යක්ෂ තනතුර ක්‍රියාත්මක වූයේ ද වැඩ බලන පදනම මතය. 2010 වර්ෂය එම ආයතනයේ ආරම්භයේ සිට බලන කල යම් ඉඩ පහසුකමක් සහිතව පරිපාලන කාර්ය මණ්ඩලයේ සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ අනුමත තනතුරුවලට අදාළ කාර්ය මණ්ඩලයෙන් සමන්විත වූ ප්‍රථම වර්ෂය විය. ශිෂ්‍ය ක්‍රියාකාරීත්වයේ ද ප්‍රගතියක් මෙම වර්ෂයේ දී දක්නට ලැබුණි.

(ආ) ජයග්‍රහණයන්

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සමාරම්භයේ සිට බලන කල 2010 වර්ෂය සියලු පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයන්හි අනුමත සියලු තනතුරුවලට අදාළ කාර්ය මණ්ඩලයෙන් සමන්විතව ගතවූ වසරක් ලෙස සඳහන් කළ හැකිය.

2010 වර්ෂයේ මැයි මාසයේ දී ශාස්ත්‍රපති පාඨමාලාව සඳහා අයදුම්පත් කැඳවන ලදී. ඒ සඳහා ලැබුණු ප්‍රතිචාර ඉතා යහපත් වූ අතර අයදුම්පත් 93 ක් නිකුත් වී තිබුණි. එසේ වුවද බඳවා ගැනීමේ පරීක්ෂණයේ තත්ත්වය පෙර වර්ෂයන්හි මෙන්ම සතුටුදායක තත්ත්වයක නොවීය. ශාස්ත්‍රපති පාඨමාලාව සඳහා බඳවා ගැනීමට සුදුසුකම් සපුරාලන ලද්දේ සිසුන් තිස් දෙදෙනෙකු (32) පමණි. නව සිසුන් විසි තුන් දෙනෙක් (23) ශාස්ත්‍රපති පාඨමාලාව සඳහා ලියාපදිංචි කරන ලද අතර සිසුන් විසි අට දෙනෙක් නැවත ලියාපදිංචි වූහ.

මෙම වර්ෂය තුළ 2009 වර්ෂයේ දී පර්යේෂණ කටයුතු ආරම්භ කරන ලද සිසුහු අට දෙනෙක් ඔවුන්ගේ පර්යේෂණ නිබන්ධනයට අදාළ වැඩ කටයුතුවල නිරතව සිටියහ. වර්ෂය අවසානයේ දී තවත් ශිෂ්‍යයෝ හතර දෙනෙක් සියලු පාඨමාලා කටයුතු නිමවා පර්යේෂණ නිබන්ධනයට අදාළ කටයුතු කරමින් සිටියහ.

ශාස්ත්‍රපති පාඨමාලාවේ නවක සිසුන්ගේ ප්‍රවේශයත් සමඟ ආයතනයේ අපේක්ෂිත අදායම වර්ධනය විය.

(ආ) අසමර්ථ්‍යයන් හා සනාතනය

2010 වර්ෂයේ දී අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ඌනතාව හේතුවෙන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය නව අධ්‍යයන පාඨමාලා කිසිවක් ස්ථාපනය කිරීමට අසමත් විය. 2009 වර්ෂයේ දී මෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු හෝ කථිකාචාර්යවරු කිසිවෙක් නොවූහ. ඒ හේතුවෙන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන සංයුක්ත සැලසුමෙහි අන්තර්ගත ශාස්ත්‍රපති පාඨමාලාව පමණක් සහිතව එම වර්ෂය ක්‍රියාත්මක වීමට තීරණය විය.

එම කාලය තුළ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කිරීම සඳහා අනුමැතිය අපේක්ෂාවෙන් පසුවිය. මේ සඳහා වන යෝජනාවලිය 2009 වර්ෂයේ දී ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සනාතන සභාවෙන් අනුමත වූ අතර එය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම වෙත ඉදිරිපත් කොට තිබුණි. කෙසේ හෝ 2010 වර්ෂයේ නොවැම්බර් මස දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත දන්වන ලද්දේ මෙම පාඨමාලාව සඳහා අනුමැතිය ලබා දී ඇති බවයි.

(ඇ) අනාගත සැලසුම්

1. දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කිරීම.
2. අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම.
3. ඉංග්‍රීසි සාහිත්‍ය ඉගැන්වීම පිළිබඳ අධ්‍යයන මණ්ඩලයක් (Board of Study) ස්ථාපිත කිරීම.

(ඉ) සම්පත් හා ශිෂ්‍ය තොරතුරු

ආයතනය	**පාඨමාලාව**	**සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව**	**සමස්ත අධ්‍යයන කාර්ය මණ්ඩලය**	**සමස්ත අනධ්‍යයන කාර්ය මණ්ඩලය**
පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය (PGIE)	දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව (MA in TESL)	51	01 (Director)	05
මුළු ගණන	**01**	**51**	**01**	**05**

(ඊ) දේශීය ශිෂ්‍ය තොරතුරු

ආයතනය	පාඨමාලාව	මාධ්‍යය	2010 ශිෂ්‍ය කණ්ඩායම	පළමු වසර ශිෂ්‍යයන්	දෙවන වසර ශිෂ්‍යයන්	උපාධිය සමත් වූ සිසුන්
පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය	දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව	ඉංග්‍රීසි	23	17	11	-
මුළු ගණන			**23**	**17**	**11**	**-**

(උ) අධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

ආයතනය	විෂය	මාධ්‍යය	ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	මහාචාර්ය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	කථිකාචාර්ය	ආධුනික කථිකාචාර්ය	උපදේශක
පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන ය		ඉංග්‍රීසි	01 (අධ්‍යක්ෂ)	-	-	-	-	-
මුළු ගණන			**01**	**-**	**-**	**-**	**-**	**-**

(ඌ) අනධ්‍යයන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු

ආයතනය	ජ්‍යෙෂ්ඨතම කාර්ය මණ්ඩලය	ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය	කනිෂ්ඨ කාර්ය මණ්ඩලය	සුළු සේවක
පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය	-	02	02	01
මුළු ගණන	-	02	02	01

(එ) පර්යේෂණ නව සොයාගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ තොරතුරු

විෂය	ප්‍රකාශිත	මුද්‍රිත	ඉදිරිපත් කිරීම්
(අ) පර්යේෂණ			
(ආ) නව සොයාගැනීම්			
(ඇ) වාර සඟරා			
(ඈ) පොත්	01 *		
(ඉ) ශාස්ත්‍රීය ලිපි			
(ඊ) වෙනත්			

* "From experiment to Excellence"

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඉතිහාසය (මහාචාර්ය උපාලි විදානපතිරණ සමඟ)

(ඒ) වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු පිළිබඳ තොරතුරු

විෂය	**සහභාගිවීම්**	**සම්පූර්ණ කරන ලද**	**ඉදිරිපත් කරන ලද**
(අ) පශ්චාද් උපාධි පාඨමාලා	02	-	-
(ආ) පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලා	-	-	-
(ඇ) උපාධි පාඨමාලා	-	-	-
(ඈ) ඩිප්ලෝමා පාඨමාලා	-	-	-
(ඉ) සහතිකපත්‍ර පාඨමාලා	-	-	-
(ඊ) වෙනත්	-	-	-
මුළු ගණන	02	-	-

(ඓ) මෙම වාර්තාවට අදාළ වෙනත් තොරතුරු/ක්‍රියාකාරීත්වයන්

ELM2601 – පර්යේෂණ නිබන්ධය සඳහා අන්තර්ජාලය මඟින් සම්බන්ධ විය හැකි පාඨමාලාවක් ස්ථාපිත කරන ලදී.

ELM2106 විෂය ද අන්තර්ජාලය මඟින් පහසුකම් සපයන විෂයක් ලෙස ශිෂ්‍යන්හට ප්‍රයෝජනවත් සේවාවක් සපයන ලදී. මෙම විෂය හදාරන ලද ශිෂ්‍යන්ගෙන් බොහෝ දෙනෙක් දුර බැහැර විශ්වවිද්‍යාල හෝ පාසැල්වල සේවයේ නියතු අය හෙයින් නාවල පිහිටි පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට පැමිණ සේවය ලබා ගැනීම ඔවුන්ට දුෂ්කර විය.

5. අධ්‍යක්ෂ වාර්තාව

අධ්‍යයන ප්‍රගතිය

2010 වසරේ දී ඉහත සඳහන් කළ පරිදි කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම හේතුවෙන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට නව අධ්‍යයන වැඩසටහන් හඳුන්වාදීමට හැකියාවක් නොලැබුණි. 2009 වර්ෂයේ දී මෙන් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තත්ත්වය ඉතා අවම විය. කිසිදු ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු හෝ කථිකාචාර්යවරයෙකු නොවීය. මේ හේතුවෙන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ශාස්ත්‍රපති උපාධි පාඨමාලාවට අදාළ කාර්යයන් සංයුක්ත සැලසුමෙහි සඳහන් පරිදි පමණක් සිදුකිරීමට තීරණය විය.

2010 මැයි මස දී ශාස්ත්‍රපති පාඨමාලාව සඳහා පුවත්පත් නිවේදනය පළ කෙරිණි. මේ සඳහා සතුටුදායක ප්‍රතිචාර ලැබුණු අතර අයදුම්පත් 93 ක් නිකුත් කෙරිණි. කෙසේ වෙතත් බඳවාගැනීමේ තරග විභාගයේ ශිෂ්‍ය ක්‍රියාකාරීත්වය ඊට පෙර වර්ෂයේ තරම් සතුටුදායක මට්ටමක නොවීය. ශිෂ්‍යයන් 32 ක් පමණක් ශාස්ත්‍රපති උපාධිය සඳහා ලියාපදිංචිවීමට සුදුසුකම් ලැබීය. නවක ශිෂ්‍යයන් 23 දෙනෙක් ලියාපදිංචි කරන ලදී. එමෙන්ම සිසුන් 28 දෙනෙක් නැවත ලියාපදිංචිය ලබා ගත්හ.

මෙම වර්ෂය තුළ දී 2009 වර්ෂයේ දී අධ්‍යයන කටයුතු ආරම්භ කරන ලද සිසුන් 08 දෙනෙක් ඔවුන්ගේ පර්යේෂණ නිබන්ධ වැඩකටයුතුවල නියැලිණි. මෙම වර්ෂය අවසාන වෙත්ම තවත් ශිෂ්‍යයන් හතර දෙනෙක් පාඨමාලා කටයුතු අවසන් කොට පර්යේෂණ නිබන්ධය සඳහා කටයුතු ආරම්භ කොට ඇත.

මෙම වර්ෂය තුළ දී ද පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය අපේක්ෂාවෙන් පසුවිය. මෙම යෝජනාව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය සනාතන සභාව මඟින් 2009 වසරේ දී අනුමත කරන ලද අතර ඉන් අනතුරුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී. නමුත් මේ දක්වා අදාළ අනුමැතිය ලැබී නොතිබුණි.

ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා නවක සිසුන් බඳවා ගැනීමත් සමග ආයතනයේ ආදායම වර්ධනය විය.

2009/2010 ශිෂ්‍ය ක්‍රියාකාරීත්වය

සටහන - 01

2009/2010 අවසාන ඇගැයීමේ දී ශිෂ්‍ය ක්‍රියාකාරිත්වය

	LSP 2301	LSP 2202	LSP 2203	LSP 2204	LSP 2101	LSP 2102	LSP 2104	LSP 2106	LSP 2107
විභාගයට පෙනී සිටි සමස්ත පිරිස	14	07	01	03	04	5	01	12	09
සමත්වූවන්	09	04	01	03	04	05	01	12	08
අසමත්වූවන්	05 (35.7%)	03 (42.8%)	0 (0%)	0 (0%)	0 (0%)	0 (0%)	0 (0%)	0 (0%)	01 (11%)

පර්යේෂණ

2010 වර්ෂය තුළ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පර්යේෂණ කටයුතු සඳහා කරන ලද කැප කිරීම වර්ෂය පුරාම පැවතුණි. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වාර්ෂික පර්යේෂණ සැසිය 2010 වර්ෂයේ දී නොපැවැත්විණි. එය අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ ඌනතාව හේතුවෙන් ඊළඟ වර්ෂයේ මුල් භාගය දක්වා කල් දමන ලදී.

නව වැඩ සටහන් හා පාඨමාලා

ELM2601 – පර්යේෂණ නිබන්ධනය සඳහා අන්තර් ජාලය ඔස්සේ අධ්‍යයනය කළ හැකි පාඨමාලාවක් ස්ථාපනය කරන ලදී. ELP2101 (Research Methods and Design) විෂය සඳහා ද උක්ත පහසුකම් ලබා දෙන ලද්දේ නාවල පිහිටි පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයෙන් ඉතා දුර බැහැර පිහිටි විශ්වවිද්‍යාල හෝ පාසල්වල ශිෂ්‍යයන්ගෙන් බොහෝ දෙනෙක් සේවයේ නියුතුව සිටි බැවිනි.

කාර්ය මණ්ඩලය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි පිළිබඳ මහාචාර්ය ආර්. රහීම් මෙය, 2010 මැයි මස 09 තෙක් වැඩබලන අධ්‍යක්ෂ තනතුරෙහි කටයුතු කළාය. නැවත 2010 ජුලි මස 01 දින සිට අධ්‍යක්ෂ තනතුරට (ස්ථිර) පත් වූවාය.

2010 මැයි මස 10 දින සිට ජූනි මස 30 දින තෙක් ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයන අංශයේ අංශ ප්‍රධාන බී.කේ.පී. අබේසූරිය මිය වැඩ බලන අධ්‍යක්ෂ තනතුරෙහි කටයුතු කළාය.

ආචාර්ය එච්.එස්. රඹුක්වැල්ල මහතා ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර සඳහා නම් කරන ලද අතර ඒ සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය බලාපොරොත්තුවෙන් පසුවිය.

අධ්‍යයනකරුවන්හට කෙරෙන උපකාර

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පුස්තකාලය මඟින් දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ ශාස්ත්‍රපති පාඨමාලාව සඳහා 2010 වසරේදී ද අගනා සහයක් ලබා දුනි. මෙම පුස්තකාලය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යයන සම්පත්වල කෝෂ්ඨාගාරය වේ. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පුස්තකාලයාධිපතිනිය ද දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ අධ්‍යයන මණ්ඩලයේ (Board of Study) සාමාජිකාවක ලෙස ක්‍රියා කළාය.

කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ක්‍රියාකාරකම්

මහාචාර්ය ආර්. රහීම් මෙය, වැඩබලන අධ්‍යක්ෂ

විධායක කමිටුව, විදේශීය භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ආසියානු සංවිධානයේ සාමාජික (දකුණු කොරියා - සියොල් නගරයේ පිහිටි)

සභාපති, මිතුරුවැල - පිළිකා ආධාර ජාලය, කොළඹ

කොළඹ විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි අධ්‍යයන අංශයේ විභාග පරීක්ෂක

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශයේ ආරාධිත දේශක සහ විභාග පරීක්ෂක

සහයෝගය සහ සංයෝගය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානයේ (SDC) අනුග්‍රහය ඇතිව පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලයේ වැඩසටහන් සඳහා සහාය ලබදෙන ලදී.

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ සියලු කාර්යයන්හි දී සිය සහාය ලබාදුනි.

2010 වර්ෂය තුළ දී පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යයන් සඳහා උපකුලපති තුමා, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය පාලක සභාව, ලේඛකාධිකාරී, මූල්‍යාධිකාරී, පුස්තකාලයාධිපති ආචාර්ය ගයාත්‍රි ජයතිලක සහ සීතා කුලසේකර යන මහත්ම මහත්මීන් අධ්‍යාපන තාක්ෂණ අංශයන්ගෙන් සහ උපකුලපතිතුමාගේ කාර්ය මණ්ඩලයෙන් ද අවශ්‍ය සහයෝගය ලබා දෙන ලදී.

ශාස්ත්‍රපති පාඨමාලාවේ ස්වාධීන නිබන්ධයන්ට අවශ්‍ය සහාය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ භාෂා අධ්‍යයනාංශයේ පී. අබේසූරිය මිය, ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි අධ්‍යයන ඒකකයේ හිටපු අධ්‍යක්ෂ එල්. කුමාරණතුංග මිය, කැලණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයේ ඩී. ප්‍රනාන්දු මෙය,කේ පෙරේරා මෙය සහ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සමාජ අධ්‍යාපන අධ්‍යයනාංශයේ එල්.ඩී.අයි. විජේතුංග මයා යන අය විසින් ලබාදෙන ලදී.

සටහන

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යයන් සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය අධ්‍යයන හා අනෙකුත් කාර්ය මණ්ඩලයෙන් සහ අනෙකුත් ජාතික විශ්වවිද්‍යාලයන්ගෙන් ලබා දෙන ලද සහයෝගය ස්තුති පූර්වකව සිහිපත් කරන්නෙමු. මෙවන් සහයෝගයක් නොලැබෙන්නට අප ආයතනය ක්‍රියාත්මක මට්ටමෙන් පවතින්නට හැකියාවක් නොලැබෙන්නට ඉඩ තිබුණි.

6. මූල්‍ය ප්‍රකාශය (නව ආකෘතිය අනුව)

(අ) පුනරාවර්තන වියදම් පිළිබඳ තොරතුරු

විෂය	2009 වර්ෂයේ රුපියල්	2010 වර්ෂයේ රුපියල්
(අ) පුද්ගල පඩි නඩි හා ගෙවීම්	1,624,601.85	2,603,399.41
(ආ) ගමන් වියදම්	17,372.00	35,600.00
(ඇ) සැපයුම්	236,389.12	160,186.37
(ඈ) නඩත්තු	-	67,952.00
(ඉ) කොන්ත්‍රාත් සේවා	220,495.38	337,752.72
(ඊ) වෙනත්	344,862.60	322,779.98
එකතුව	2,443,720.95	3,527,670.48

(ආ) ප්‍රාග්ධන වියදම් පිළිබඳ තොරතුරු

විෂය	2009 වර්ෂයේ රුපියල්	2010 වර්ෂයේ රුපියල්
(අ) ගෘහ උපකරණ හා කාර්යාලයීය උපකරණ අත්පත් කර ගැනීම.	824,626.20	30,374.40
(ආ) යන්ත්‍රසූත්‍ර අත්පත් කර ගැනීම	684,050.00	-
(ඇ) ගොඩනැගිලි හා සැලසුම් අත්පත් කර ගැනීම	-	-
(ඈ) වෙනත්	-	118,897.12
එකතුව	1,508,676.20	149,271.52

(ඇ) මූල්‍ය ප්‍රගතිය(වියදම) පිළිබඳ තොරතුරු

විෂය	2010 වර්ෂයේ ප්‍රතිපාදන රු.	2010 වර්ෂයේ වියදම රු.	ඉතිරිය/හිඟය රු.
(අ) ව්‍යාපෘති හැර පුනරාවර්තන වියදම්	4,823.000.00	3,527,670.48	1,295,329.52
(ආ) ව්‍යාපෘති හැර මූලධන වියදම්	1,000,000.00	149,271.52	850,728.48
(ඇ) ව්‍යාපෘති - දේශීය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක	-	-	-
(ඈ) ව්‍යාපෘති - විදේශීය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක	-	-	-
එකතුව	5,823,000.00	3,676,942.00	2,148,058.00

(ඈ) මූල්‍ය ප්‍රගතිය පිළිබඳ තොරතුරු (උපයන ලද ආදායම්)

ආදායම් ප්‍රභවය	2010 වර්ෂයේ ප්‍රතිපාදන රු.	2010 වර්ෂයේ එකතුව රු.	අතිරික්තය/හිඟය
(අ) ප්‍රථම උපාධි අපේක්ෂකයන්	-	-	-
(ආ) පශ්චාද් උපාධි අධ්‍යයන	550,000.00	1,349.470.00	799,470.00
(ඇ) උපදේශක සේවා	-	-	-
(ඈ) වෙනත්	200,000.00	307,755.50	107,755.50
එකතුව	750,000.00	1,657,225.50	907,225.50

(ඉ) මූල්‍ය ක්‍රියාකාරීත්ව විශ්ලේෂණය - 2010

විෂය	විග්‍රහය	ඒක ශිෂ්‍ය පිරිවැය රු.
(අ) ඒක ශිෂ්‍ය පුනරාවර්තන පිරිවැය	පුනරාවර්තන වියදම්/ශිෂ්‍ය සංඛ්‍යාව	69,170.01
(ආ) ඒක ශිෂ්‍ය මූලධන පිරිවැය	මූලධන වියදම/ශිෂ්‍ය සංඛ්‍යාව	2,926.89
එකතුව		72,096.90

7. විගණන කමිටුවේ වාර්තාව

අභ්‍යන්තර විගණන වාර්තාව

විශ්වවිද්‍යාලයීය අභ්‍යන්තර විගණන ඒකකය විසින් ස්වකීය විගණන කටයුතු ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ඒකකයට අදාළව විධිමත් පරිදි ගත වූ වර්ෂයට අදාළව සිදු කරන ලදී. ඒ අනුව පහත සඳහන් ක්ෂේත්‍රයන්හි අභ්‍යන්තර විගණන අංශයේ අධීක්ෂණයට හසු වී ඇත.

1. **පූර්ව විගණනය**

- විශ්වවිද්‍යාලයීය අර්ථසාධක අරමුදලේ මුදල් නිදහස් කිරීම. } ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
- ග්‍රැටිවිටි (Gratuity) ගෙවීම. }
- කොන්ත්‍රාත් සඳහා අවසන් ගෙවීම් සහ රැඳවුම් නිදහස් කිරීම.

2. **සමීක්ෂණ**

- වාර්ෂික තොග සමීක්ෂණය (ප්‍රධාන ගබඩාවේ) 2010.12.31 දිනට සිදු කෙරිණි.

3. **සොයා ගන්නා ලද තත්වයන්ට අදාළ විගණන විමසුම්**

- ඉන්ධන පරිභෝජනය
- සුළු මුදල් පාලනය
- කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්
- ස්ථාවර වත්කම් ලේඛනය
- බෙදාහැරීමේ ඒකකය
- වාර්ෂික ස්ථාවර වත්කම් සමීක්ෂණය

} ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

- වාර්ෂික විගණනය - පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

4. **විශ්වවිද්‍යාල වෙත යවන ලද වාර්තා**

- NSF ව්‍යාපෘතියේ අරමුදල් - ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

5. **විගණන කමිටුව**

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයීය විගණන කමිටුව ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ සහ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ කාර්යයන් විමසා බැලීම සඳහා නිරන්තරයෙන් අදාළ රැස්වීම් පවත්වනු ලබයි. මෙම කමිටුව මඟින් විගණකාධිපති සහ අභ්‍යන්තර විගණන අංශය මඟින් ඉදිරිපත් කරන ලද විගණන විමසුම් හා වාර්තා සහ ඒ සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයත් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයත් විසින් සපයනු ලැබ ඇති පිළිතුරු සලකා බලයි. මෙම කමිටුව මඟින් නිවැරදි ක්‍රියාමාර්ගයන් සඳහා මඟ පෙන්වීම සහ උපදෙස්දීම සිදු කරයි. පසුව සිදුවන නිවැරදි ක්‍රියාමාර්ගයන් පිළිබඳව ද අධීක්ෂණය කෙරේ. සලකා බලන වර්ෂයේ දී විගණන කමිටුව සත් වරක් රැස් වී ඇත.

6. කාර්ය මණ්ඩලය

අභ්‍යන්තර විගණන අංශය පහත සඳහන් කාර්ය මණ්ඩලයෙන් සමන්විතයි.

- සහකාර අභ්‍යන්තර විගණකවරයෙක්
- විගණන සහකාරවරයෙක්
- ජ්‍යේෂ්ඨ මාණ්ඩලික සහකාරවරයෙක්
- පරිගණක යෙදවුම් සහකාරවරයෙක්
- කම්කරුවෙක්

<u>සටහනඃ නැවත විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනය</u>

2011 ජුනි 10 වෙනි දින නිකුත් කරන ලද අංක HE/PL/140 දරන උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලිපියට අනුව විමසා තිබුණේ ගිණුම් වාර්ෂික වාර්තාවේ සඳහන් ආකෘතියට අනුව ඉදිරිපත් කළ යුතු බවයි. ඒ අනුව මෙහි පිටු අංක 14, 15 (මෙම වාර්තාවේ අංක 06 කොටස) දරන ගිණුම් ඉහත උපදෙස් අනුව සකස් කොට ඇත.

කෙසේ වෙතත්, ඉදිරිපත් කරන ලද ගිණුම් පිළිබඳ විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුව කලින් භාවිත වූ ආකෘතියට අනුව ලබා දී ඇත. විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද ගිණුම් විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුව කලින් භාවිත වූ ආකෘතියට අනුව ලබා දී ඇත. විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද ගිණුම් විගණකාධිපතිවරයාගේ වාර්තාවේ 8 වෙනි කොටස ලෙස සම්බන්ධ කොට ඇත.

8. විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

PGIE
POST GRADUATE
INSTITUTE OF
ENGLISH

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මූල්‍ය වාර්තාව

2010

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
2010.12.31 දිනට
ශේෂ පත්‍රය

31.12.2009 රු.		සටහන් අංකය		31.12.2010 රු.
	<u>වත්කම්</u>			
	<u>ජංගම නොවන වත්කම්</u>			
2,555,822.67	දේපල පිරියත හා උපකරණ	14		2,073,892.71
	<u>ජංගම වත්කම්</u>			
4,752,109.00	කෙටි කාලීන ආයෝජන	15	4,496,832.82	
-	තොග		140,634.42	
9,646.00	සේවක ණය හා අත්තිකාරම්	16	232,084.00	
-	සැපයුම් සහ සේවා සඳහා අත්තිකාරම්		118,897.12	
-	විවිධ අත්තිකාරම්		-	
28,104.27	විවිධ ණයගැතියෝ		37,842.81	
582,236.04	බැංකුවේ ඇති මුදල්	17	1,162,556.78	
				6,188,847.95
7,927,917.98				**8,262,740.66**
	<u>ස්කන්ධය හා වගකීම්</u>			
	<u>ප්‍රාග්ධනය හා සංචිත</u>			
	<u>ප්‍රාග්ධනය</u>			
2,514,503.67	වැය කළ මූලධන ප්‍රතිපාදන		2,192,789.83	
(2,063.58)	වැය නොකළ මූලධන ප්‍රතිපාදන	18	100,707.90	
-	තොරතුරු තාක්ෂණ ප්‍රතිපාදන		-	
	<u>සංචිත</u>			
(447,689.23)	පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා අරමුදල		571,142.00	
2,064,750.86				2,864,639.73
	<u>ජංගම නොවන වගකීම්</u>			
	<u>විශේෂිත අරමුදල්</u>			
108,788.00	ප.උ.ඉ.භා. ආයතන සංවර්ධන අරමුදල		4,007,085.60	
702,903.00	පාරිතෝෂික සඳහා වෙන්කිරීම්		754,003.00	
4,566,672.60	IRQUE ව්‍යාපෘතිය	19	-	
				4,761,088.60
	<u>ජංගම වගකීම්</u>			
291,218.38	උපචිත වියදම්	20	375,202.66	
71,685.14	විවෘත විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු		261,809.67	
121,900.00	විවිධ ණයහිමියෝ		-	
				637,012.33
7,927,917.98				**8,262,740.66**

පිළියෙල කළේ වැ.බ.සහකාර මූල්‍යාධිකාරී

කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන්

වැ.බ.අධ්‍යක්ෂක

වැ.බ.සහකාර ලේඛකාධිකාරී

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

2010.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

ආදායම් වියදම් ගිණුම

2009 (රු)		සටහන් අංකය		2010 (රු)
	ආදායම			
2,018,500.00	රජයේ ආධාර - පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන			2,748,000.00
142,705.47	රජයේ ආධාර - පුනරුත්තාපන පුනරාවර්තන			6,638.00
9,920.00	ලියාපදිංචි ගාස්තු			40,100.00
141,660.00	අධ්‍යයන ගාස්තු			963,980.00
31,500.00	විභාග ගාස්තු			73,500.00
326,762.96	පොලී ආදායම්			304,705.50
-	අයදුම්පත් විකුණුම් ආදායම්			93,000.00
3,240.00	විවිධ ලැබීම්			3,050.00
7,740.00	පරිපූරක ගාස්තු			15,420.00
8,500.00	නිබන්ධන ගාස්තු			163,470.00
225,508.64	ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්ෂය			512,304.36
2,916,037.07	මුළු ආදායම			**4,924,167.86**
	වියදම්			
2,443,720.95	සාමාන්‍ය පරිපාලන හා අධ්‍යයන සේවා වියදම්	21	3,527,670.48	
142,705.47	වියදම් - පුනරුත්තාපන		6,638.00	
225,508.64	ක්ෂය සඳහා වෙන් කිරීම්		512,304.36	
282,563.00	පාරිතෝෂික සඳහා වෙන් කිරීම්		51,100.00	
3,094,498.06	මුළු වියදම			**4,097,712.84**
(178,460.99)	අතිරික්තය/ඌනතාව			**826,455.02**
(330,932.72)	ඉ/ගෙ ශේෂය			**(447,689.23)**
61,704.48	**පූර්ව වර්ෂ ගැලපීම්**			**192,376.21**
(447,689.23)	ප/ගෙ ශේෂය			**571,142.00**

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 **වාර්තා කිරීමේ අස්ථිත්වය**

2005 අංක 04 දරන පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන නියමාවලිය යටතේ පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය පිහිටුවා ඇත. 2006 ඔක්තෝම්බර් 01 දින සිට එහි මෙහෙයුම් ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදී.

2. **අනුකූලතා ප්‍රකාශනය.**

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගණකාධිකරණ මූලධර්මයන්ට ද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට ද , 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ අවශ්‍යතාවන් හා 2002 වර්ෂයේ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක PF/PE 21ට අනුකූලව පිළියෙල කර ඇත.

3. **ඇගයීමේ පදනම**

ඓතිහාසික පිරිවැය පදනම යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

4. **රජයේ ප්‍රතිපාදන**

ගිණුම් වර්ෂය තුළ රජයෙන් ලැබුණු මුළු ප්‍රතිපාදන ප්‍රමාණය රු. 3,048,000.00 වේ. මෙයින් රු. 2,748,000.00 ක් පුනරාවර්තන වියදම් හඳුනාගෙන ඇති අතර එය ආදායම් ප්‍රකාශනයේ ආදායමක් ලෙස දක්වා ඇත. මූලධන වියදම් සඳහා ලද රජයේ ආධාර මුදල වැය නොවූ මූලධන ආධාර යටතේ ගිණුම් ගත කර ඇති අතර වැය කළ මුදල ප්‍රාග්ධන ගිණුමට මාරු කර ඇත. අදාළ තොරතුරු පහත පරිදි වේ.

	2010 වර්ෂයේ දී ලැබුණු මුදල (රු.)	වැය නොකළ මුදල (රු.)
පුනරාවර්තන ආධාර	2,748,000.00	-
ප්‍රාග්ධන ආධාර		
පුනරුත්තාපන - ගොඩනැගිලි හා සවිකිරීම්	-	-
ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	200,000.00	825.60
පුස්තකාල පොත් හා වාර සඟරා	100,000.00	31,102.88
එකතුව	3,048,000.00	31,928.48

5. **මූලධන වියදම් ප්‍රතිපාදන ක්‍රමක්ෂය**

මූලධන වියදම් සඳහා ලද ප්‍රතිපාදන ප්‍රාග්ධනිතකර අදාළ වත්කම්හි ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ ක්‍රමක්ෂය කෙරේ. මිලදීගත් වර්ෂයේ දී ක්‍රමක්ෂය නොකිරීම හා අවසාන වර්ෂයේ දී සම්පූර්ණ වර්ෂය සඳහා ක්‍රමක්ෂය කිරීම ආයතනයේ ක්‍රමක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය වේ.

6. **ආදායම හඳුනා ගැනීම**

රජයෙන් ලැබුණු ප්‍රදානයන් ඒවා ලැබුණු පදනම මත ගිණුම්ගත කර ඇති අතර පාඨමාලා ගාස්තුව හා අනෙකුත් ආදායම් ඒවා එකතු කරගනු ලබන අවස්ථාවේ දී ආදායමක් ලෙස හඳුනාගෙන ඇත.

7. **වියදම් හඳුනා ගැනීම**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කර ඇති වියදම් ශීර්ෂයන්ට අනුකූලව වියදම් වර්ගීකරණය හා විශ්ලේෂණය සිදුකර ඇත.

8. **බද්ද කරණය**
දේශීය ආදායම් පනතේ විධානයන්ට අනුව පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ලාභාංශ හා පොලී හැර අනෙකුත් ආදායම්, ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

9. **සේවකයන් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ**
වර්ෂ 05 ක අඛණ්ඩ සේවාකාලයක් සහිත කාර්ය මණ්ඩල සාමාජිකයන් වෙනුවෙන් විශ්‍රාම පාරිතෝෂික සඳහා වෙන් කිරීම් කර ඇත.

10. **වගකීම්**
හඳුනාගත් සියලු වගකීම් ගිණුම් ගත කර ඇත. ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් සැපයූ පොදු පහසුකම් පිරිවැය වෙනුවෙන් කළ යුතු ගෙවීම් ගිණුම් ගතකර නොමැත.

11. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පවතින සීමිත ඉඩ පහසුකම් හේතුවෙන් වර්ෂය තුළ මිලදීගත් පොත් පත් හා වාර සඟරා විවෘත විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පුස්තකාලය වෙත පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ ශිෂ්‍යයන්ගේ පරිහරණය සඳහා බාරදී ඇත.

12. විවෘත විශ්වවිද්‍යාලයේ පුස්තකාලය විසින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන සඳහා වෙන්කර ඇති කොටසේ පාවිච්චි සඳහා පරිගණක යන්ත්‍ර 03 ක් හා UPS යන්ත්‍ර 03 ක් බාරදී ඇත.

13. **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**
වක්‍ර ක්‍රමය අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය වක්‍ර ක්‍රමය අනුව පිළියෙල කර ඇත.

14. **දේපල පිරියත හා උපකරණ**

(අ) 05.10.1995 දින දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍ර ලේඛ අංක 649 අනුව දේපල පිරියත හා කාර්යාල උපකරණ ක්ෂය කර ඇත. වත්කම මිලදීගත් වර්ෂයේ ක්ෂය නොකරන අතර වත්කම් ඉවත්කරන වර්ෂයේ මුළු වර්ෂයටම ක්ෂය ගණනය කිරීම ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය වේ.

(ආ) පිළිගත් වාර්ෂික ක්ෂය ප්‍රතිපාදන ප්‍රතිශතයන් පහත පරිදි වේ.

❖ ගෘහභාණ්ඩ හා සවිකිරීම්	10%
❖ කාර්යාල උපකරණ	20%
❖ පරිගණක හා උපාංග	20%
❖ පුස්තකාල පොත්	20%

(ඇ) ක්ෂය ප්‍රතිශතයන්හි වෙනස්කම හේතුවෙන් ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ, ගෘහභාණ්ඩ හා සවිකිරීම් සහ කාර්යාල උපකරණ ලෙස නැවත වර්ගීකරණය කරන ලදී.

(ඈ) ස්ථාවර වත්කම් සමුච්චිත ක්ෂය අඩුකළ පසු වටිනාකමට දක්වා ඇත.

(ඉ) ස්ථාවර වත්කම්වල ගණනය කරන ලද අපේක්ෂිත ඵලදායී ජීවිත කාලය මත සරල මාර්ග ක්‍රමය අනුව ක්ෂය ආදායම් ප්‍රකාශණයේ හඳුනාගෙන ඇත.

(ඊ) ජංගම නොවන වත්කම් පිළිබඳ තොරතුරු

පිරිවැය	ගෘහභාණ්ඩ හා සවිකිරීම්	කාර්යාල උපකරණ	පුස්තකාල පොත් හා වාර සඟරා	පරිගණක හා උපාංග	එකතුව
01/01/2010 දිනට ශේෂය	447,883.61	1,144,657.00	479,508.78	1,093,627.72	3,165,677.11
එකතුකළා: වර්ෂය තුළ මිලට ගැනීම්	33,374.40	-	-		33,374.40
31/12/2010 දිනට ශේෂය	478,258.01	1,144,657.00	479,508.78	1,093,627.72	3,196,051.51
ක්ෂය					
01/01/2010 දිනට ශේෂය	29,848.84	94,980.40	403,109.66	81,915.54	609,854.44
එකතුකළා: වර්ෂය සඳහා ක්ෂය	44,788.36	228,931.40	19,859.06	218,725.54	512,304.36
31/12/2010 දිනට ශේෂය	74,637.20	323,911.80	422,968.72	300,641.08	1,122,158.80
01/01/2010 දිනට ශුද්ධ වටිනාකම	418,034.77	1,049,676.60	76,399.12	1,011,712.18	2,555,822.67
31/12/2010 දිනට ශුද්ධ වටිනාකම	403,620.41	820,745.20	56,540.06	792,986.64	2,073,892.71

(උ) සමුච්චිත ක්ෂය ප්‍රතිපාදනය හා ප්‍රාග්ධන දීමනා ක්‍රමක්ෂය ප්‍රමාණයන් සමාන වන බැවින් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා අරමුදලේ (පොදු සංචිතය) විශ්ලේෂණය අවශ්‍ය නොවේ. (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 05/10/95 දිනැති චක්‍රලේඛ අංක 649 බලන්න)

15. කෙටිකාලීන ආයෝජන

කෙටිකාලීන මුදල් අතිරික්තයන් මහජන බැංකුවේ කෙටිකාලීන ස්ථාවර තැන්පතු "මත ආයෝජනය කර ඇත". උපචිත පොලිය ද සහිතව ආයෝජනයන්හි ඉදිරියට ගෙනයන ශේෂය ගණනය කරඇත.

ගිණුම් අංකය	දිනය	01/01/2010 දිනට වටිනාකම	2010 වර්ෂය සඳහා උපචිත පොලිය	31/12/2010 දිනට ශේෂය
174-60-01-00005984-5	7/21/2008	621.106.67	36,485.06	657,591.73
174-60-01-00007239-4	8/17/2009	310.170.65	20,450.53	330,621.18
174-60-01-00007243-8	8/17/2009	1.042.402.04	65,632.23	1,108,034.27
174-60-01-00007242-9	8/17/2009	1.042.402.04	65,632.23	1,108,034.27
174-60-01-00007506-0	10/28/2009	203,179.35	12,245.88	215,425.23
174-60-01-00007507-9	10/28/2009	507,948.37	30,614.70	538,563.07
174-60-01-00007505-1	10/28/2009	507,948.37	30,614.70	538,563.07
එකතුව				4.496.832.82

16. සේවකයන් සඳහා ණය හා අත්තිකාරම්

සේවක ණය	4,760.00
ආපදා ණය	198,324.00
වාහන ණය	24,000.00
උත්සව අත්තිකාරම්	5.000.00
	232,084.00

17. බැංකුවේ ඇති මුදල්

මහජන බැංකුව ජංගම ගිණුම් අංක 174100246838310	489,731.19
මහජන බැංකුව ජංගම ගිණුම් අංක 174100156838310	562,057.37
මහජන බැංකුව ජංගම ගිණුම් අංක 174100336838310	110,768.22
	1,162,556.78

18. වැය නොවූ මූලධන ආධාර

පුනරුත්ථාපන - ගොඩනැගිලි හා සවිකිරීම්	60,656.53
පුනරුත්ථාපන - යන්ත්‍රසූත්‍ර හා උපකරණ	35,000.00
ගෘහභාණ්ඩ හා කාර්යාල උපකරණ	3,457.25
පුස්තකාල පොත් හා වාර සඟරා	1,594.10
එකතුව	100,707.90

19. **IRQUE** ව්‍යාපෘතිය

ජාතික විශ්වවිද්‍යාලයන්හි සහ පෞද්ගලික අංශයේ ආයතන කිපයක ශිෂ්‍යයන්ගේ ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාවය පරීක්ෂා කිරීමට විභාගයක් පැවැත්වීම සඳහා පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ IRQUE ව්‍යාපෘතිය අතර ගිවිසුමක් ඇතිකරගන්නා ලදී. මෙම ගිවිසුම යටතේ අදාළ ව්‍යාපෘතිය සඳහා රු 6,623,925.00 ක් ලැබුණි.

01/01/2010 දිනට ශේෂය		4,566,672.60
අඩුකලා 2010 වර්ෂය තුළ දැරූ වියදම්		
විභාග පිළියෙල කිරීම	5,000.00	
විභාග පැවැත්වීම	98,250.00	
පිළිතුරු පත්‍ර ලකුණු කිරීම	126,525.00	
ව්‍යාපෘති සම්බන්ධීකරණය	179,000.00	
අතුරු වාර්තාව	40,000.00	
විභාග සම්බන්ධීකරණය	81,000.00	
සංඛ්‍යාන විශ්ලේෂණය සහ වාර්තාව	45,000.00	
අවසන් වාර්තාව	93,600.00	
		(668,375.00)
ඉ/ගෙ/ශේෂය		3,898,297.60

20. උපචිත වියදම්

විගණන ගාස්තු 2007 (15% VAT ඇතුළුව)	59,512.50
විගණන ගාස්තු 2009 (15% VAT ඇතුළුව)	82,812.00
විගණන ගාස්තු 2010 (15% VAT ඇතුළුව)	107,900.00
විභාග සහ දිවා පාසල් වියදම් 2009	550.00
දුරකථන වියදම්	5,532.61
වි.වි. ට ගෙවිය යුතු පොදු පහසුකම් ගාස්තු	45,000.00
ඇතුලත්වීමේ විභාග ගාස්තු	10,195.00
අතිකාල වියදම්	3,729.28
බාහිර කථිකාචාර්යවරු සඳහා ගෙවීම්	31,000.00
විභාග සඳහා ගෙවීම්	5,400.00
දේශීය අදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු බදු	23,571.27
මුළු එකතුව	375,202.66

21. පුනරාවර්තන වියදම්

පුද්ගල පඩිනඩි- අධ්‍යයන		
1.1.1 වැටුප් හා වේතන	366,630.00	
1.2.1 විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	68,743.14	
1.4.1 සේවක භාරකාර අරමුදල 3%	13,748.63	
1.5 වැඩ බැලීමේ ගෙවීම්	50,905.00	
1.6 අධ්‍යයන දීමනා	91,657.50	
1.8.1 ජීවන වියදම් දීමනා	31,500.00	
1.11 බාහිර කථිකාචාර්ය ගෙවීම්	52,000.00	
		675,184.27
පුද්ගල පඩිනඩි - අනධ්‍යයන		
1.1.2 වැටුප් හා වේතන	1,329,874,50	
1.2.2 විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	139,456.81	
1.3.2 විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල	60.024.36	
1.4.2 සේවක භාරකාර අරමුදල	39.1896.24	
1.8.2 ජීවන වියදම් දීමනා	315,000.00	
1.10 භාෂා දීමනාව	17,640.00	
1.12 අතිකාල දීමනා	20,972.23	
1.13 නිවාඩු දින ගෙවීම්	5,351.00	
		1,928,215.14
2.1 ගමන් වියදම් - දේශීය		35.600.00
3.1 ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා		155.173.48
3.3 නිල ඇඳුම්		3.802.89
3.7 අනෙකුත් සැපයුම්		1,210.00
4.2 නඩත්තු - යන්ත්‍රසූත්‍ර හා උපකරණ		56,352.00
4.2 නඩත්තු - ගෘහභාණ්ඩ		11,600.00
5.2 දූරකතන වියදම්		57,191.45
5.3 තැපැල් වියදම්		30,808.00
5.9 දේශීය අධිකාරීන් වෙත වරිපනම් සහ බදු		24,146.27
5.10 මුද්‍රණ හා ප්‍රචාරණ වියදම්		225,607.00
6.2 විශේෂ සේවා - පාලක සභා හා කමිටු		74.000.00
6.3 විශේෂ සේවා - වෘත්තීය හා අනෙකුත් ගෙවීම්		107,900.00
6.6 කාර්ය මණ්ඩල සංවර්ධනය (ආචාර්යවරුන්, පරිපාලන නිලධාරීන් හා අනෙක්)		3.000.00
6.15 නිවාඩු ගමන් බලපත්‍ර		5,040.00
6.16 සංග්‍රහ වියදම්		22,615.50
6.17 බැංකු ගාස්තු		11,425.48
6.19 දායක මුදල් සහ සාමාජික ගාස්තු		4,600.00
6.21 විභාග වියදම්		27,805.00
6.22 අනෙකුත් පුනරාවර්තන වියදම්		66,393.00
මුළු වියදම		**3,527,670.48**

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
2010.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2009		2010
රු		රු
	මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්	
(178,460.99)	සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ලද අතිරික්තය/(ඌනතාව)	826,455.02
	මුදල් නොවන ප්‍රවාහයන්	
225,508.64	ක්ෂය	512,304.36
282,563.00	පාරිතෝෂික	51,100.00
(61,704.48)	පූර්ව වර්ෂ ගැලපීම්	192,376.21
225,508.64	ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්ෂය	512,304.36
165,806.49	කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය	1,069,931.23
	- තොගයේ අඩුවීම/(වැඩිවීම)	(140,634.42)
(23,744.27)	වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ අඩුවීම/(වැඩිවීම)	(351,073.66)
(298,772.13)	උපචිත වියදම් වැඩිවීම/(අඩුවීම)	152,208.81
(156,709.91)	මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	730,431.96
	ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්	
(1,508,676.20)	දේපල පිරියත හා උපකරණ මිළදී ගැනීම	(30,374.40)
4,566,672.60	විශේෂිත කාර්යන් සඳහා අරමුදල් හා ලැබීම්	(668,375.00)
	- පරිත්‍යාග ලැබීම්	-
(2,794,543.39)	ආයෝජනයන් හි වැඩිවීම	255,276.18
	- පාරිතෝෂික ගෙවීම්	-
(142,705.47)	පුනරුත්තාපන වියදම	(6,638.00)
120,747.54	ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	(450,111.22)
	මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්	
200,000.00	ප්‍රාග්ධන ප්‍රතිපාදන	300,000.00
	- තොරතුරු තාක්ෂණ ප්‍රතිපාදන	-
	- පරිත්‍යාගයන්	-
200,000.00	මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**300,000.00**
164,037.63	මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	**580,320.74**
418,198.41	කාල සීමාව ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන දෑ	**582,236.04**
582,236.04	කාල සීමාව අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ	**1,162,556.78**

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය
2010.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

	ප.උ.ඉ. ආයතනයේ අරමුදල් පොදු සංචිතය	වෙනත් අරමුදල්	වැය කළ ප්‍රාග්ධන ප්‍රතිපාදන	වැය නොකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන	මුළු වටිනාකම
31/12/2008 දිනට ශේෂය	**(330,933)**	**108,788**	**1,272,655**	**1,407,999**	**2,458,509**
පූර්ව වර්ෂ ගැලපීම්	61,704	-		-	61,704
වර්ෂය තුළ වැයකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන	142,705		1,467,357	(1,610,063)	-
වර්ෂය තුළ ලද/(වියදම්කළ) අරමුදල්		4,566,673		200,000	4,766,673
වර්ෂය තුළ ලද පරිත්‍යාගයන්					
ප්‍රාග්ධන අරමුදල් ක්‍රමක්ෂය			(225,509)		(225,509)
පුනරුත්තාපන පුනරාවර්තන වියදම	(142,705)				(142,705)
කාලච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාව)	(178,461)				(178,461)
31/12/2009 දිනට ශේෂය	**(447,689)**	**4,675,461**	**2,514,504**	**(2,064)**	**6,740,211**
පූර්ව වර්ෂ ගැලපීම්	192,376		41,319	(41,319)	192,376
වර්ෂය තුළ වැයකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන	6,638		149,272	(155,910)	-
වර්ෂය තුළ ලද/(වියදම්කළ) අරමුදල්		(668,375)		300,000	(368,375)
වර්ෂය තුළ ලද පරිත්‍යාගයන්					-
ප්‍රාග්ධන අරමුදල් ක්‍රමක්ෂය			(512,304)		(512,304)
පුනරුත්තාපන පුනරාවර්තන වියදම	(6,638)				(6,638)
කාලච්ඡේදය සඳහා අතිරික්තය/(ඌනතාව)	826,455				826,455
31/12/2010 දිනට ශේෂය	**571,142**	**4,007,086**	**2,192,790**	**100,707**	**6,871,725**

31.12.2010 දිනට ශේෂ පත්‍රය

		හර	බැර
06-07-1.1.1	වැටුප් හා වේතන අධ්‍යයන	366,630.00	
06-07-1.1.2	වැටුප් හා වේතන අනධ්‍යයන	1,329,874.50	
06-07-1.10	භාෂා දීමනාව	17,640.00	
06-07-1.11	බාහිර කථිකාචාර්ය ගෙවීම්	52,000.00	
06-07-1.12	අතිකාල දීමනා	20,972.23	
06-07-1.13	නිවාඩු දින ගෙවීම්	5,351.00	
06-07-1.2.1	විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල අධ්‍යයන	68,743.14	
06-07-1.2.2	විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල අනධ්‍යයන	139,456.81	
06-07-1.3.2	විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල අනධ්‍යයන	60,024.36	
06-07-1.4.1	සේවක භාරකාර අරමුදල 3% අධ්‍යයන	13,748.63	
06-07-1.4.2	සේවක භාරකාර අරමුදල 3% අනධ්‍යයන	39,896.24	
06-07-1.5	වැඩ බැලීමේ ගෙවීම්	50,905.00	
06-07-1.6	අධ්‍යයන දීමනා	91,657.50	
06-07-1.8.1	ජීවන වියදම් දීමනා අධ්‍යයන	31,500.00	
06-07-1.8.2	ජීවන වියදම් දීමනා අනධ්‍යයන	315,000.00	
06-07-2.1	ගමන් වියදම් - දේශීය	35,600.00	
06-07-3.1	ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	155,173.48	
06-07-3.3	නිල ඇඳුම්	3,802.89	
06-07-3.7	අනෙකුත් සැපයුම්	1,210.00	
06-07-4.2	නඩත්තු - යන්ත්‍රසූත්‍ර හා උපකරණ	56,352.00	
06-07-4.4	නඩත්තු - ගෘහභාණ්ඩ	11,600.00	
06-07-5.10	මුද්‍රණ හා ප්‍රචාරණ වියදම්	225,607.00	
06-07-5.2	දුරකථන වියදම්	57,191.45	
06-07-5.3	තැපැල් වියදම්	30,808.00	
06-07-5.9	දේශීය අධිකාරීන් වෙත වරිපනම් සහ බදු	24,146.27	
06-07-6.15	නිවාඩු ගමන් බලපත්‍ර	5,040.00	
06-07-6.16	සංග්‍රහ වියදම්	22,616.50	
06-07-6.17	බැංකු ගාස්තු	11,425.48	
06-07-6.19	දායක මුදල් සහ සාමාජික ගාස්තු	4,600.00	
06-07-6.2	විශේෂ සේවා - පාලක සභා හා කමිටු	74,000.00	
06-07-6.21	විභාග වියදම්	27,805.00	
06-07-6.22	අනෙකුත් පුනරාවර්තන වියදම්	66,393.00	
06-07-6.3	විශේෂ සේවා - වෘත්තීය හා අනෙකුත් ගෙවීම්	107,900.00	
06-07-6.6	කාර්ය මණ්ඩල සංවර්ධනය (ආචාර්යවරුන්, පරිපාලන නිලධාරීන් හා අනෙක්)	3,000.00	
	ක්ෂය ගිණුම	512,304.36	
	පාරිතෝෂික	51,100.00	
	රජයේ ආධාර - පුනරුත්තාපන පුනරාවර්තන		6,638.00
	101-2601-Building (Recurrent)	6,638.00	
	ලියාපදිංචි ගාස්තු		40,100.00
	අධ්‍යයන ගාස්තු		963,980.00
	විභාග ගාස්තු		73,500.00

ණය සහ අත්තිකාරම්වලින් ලද පොලී ආදායම්		462.84
පොලී ආදායම්		304,242.66
අයදුම්පත් විකුණුම් ආදායම්		93,000.00
විවිධ ලැබීම්		3,050.00
පරිපූරක ගාස්තු		15,420.00
නිබන්ධන ගාස්තු		163,470.00
ප්‍රාග්ධන ප්‍රතිපාදන ක්‍රමක්ෂය		512,304.36
රජයේ ආධාර - පුනරාවර්තන වියදම් සඳහා ප්‍රතිපාදන		2,748,000.00
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	478,258.01	
පුස්තකාල පොත් හා වාර සඟරා	479,508.78	
කාර්යාල උපකරණ	1,144,657.00	
පරිගණක හා උපාංග	1,093,627.72	
ක්ෂය වෙන්කිරීම් - ගෘහ භාණ්ඩ හා සවිකිරීම්		74,637.20
ක්ෂය වෙන්කිරීම් - පුස්තකාල පොත්		422,968.72
ක්ෂය වෙන්කිරීම් - කාර්යාල උපකරණ		323,911.80
ක්ෂය වෙන්කිරීම් - පරිගණක හා උපාංග		300,641.08
කෙටිකාලීන ආයෝජන	4,496,832.82	
විවිධ ණය ගැතියෝ		50.00
උත්සව අත්තිකාරම්	5,000.00	
සේවක ණය	4,760.00	
ආපදා ණය	198,324.00	
වාහන ණය	24,000.00	
මුදල් පොතේ අවසාන ශේෂය	1,162,556.78	
විවෘත විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු		261,809.67
පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා අරමුදල	255,313.02	
පුස්තකාල පොත් සඳහා අත්තිකාරම්	118,897.12	
උපචිත වියදම්		375,202.66
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්		754,003.00
ලැබිය යුතු පොලී ආදායම් ගිණුම	37,892.81	
ගබඩා අත්තිකාරම්	140,634.42	
ප්‍රාග්ධනය ගිණුම		2,192,789.83
වැය නොකළ මූලධන ප්‍රතිපාදන - පුනරුත්තාපන - ගොඩනැගිලි හා සවිකිරීම්		60,656.53
වැය නොකළ මූලධන ප්‍රතිපාදන - පුනරුත්තාපන - යන්ත්‍රසූත්‍ර හා උපකරණ		35,000.00
වැය නොකළ මූලධන ප්‍රතිපාදන - ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ		3,457.27
වැය නොකළ මූලධන ප්‍රතිපාදන - පුස්තකාල පොත් හා වාර සඟරා		1,594.10
ප.උ.ඉ.භා. ආයතන සංවර්ධන අරමුදල		4,007,085.60
මුළු එකතුව (31.12.2010)	**13,737,975.32**	**13,737,975.32**

9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: යිජ්/එච්/පීජ්අයිජ්/එෆ්ජ්/10
ඔබේ අංකය / உமது இல / Your No.:
දිනය / திகதி / Dat e: 2011 මැයි 31

අධ්‍යක්ෂ,
ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනය.

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2005 අංක 04 දරන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතන නියමාවලිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) හා 111 වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උපවගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ මුදල් පනතේ 13(7) (ඒ) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කෙරේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙනයාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගැනීම සහ යොදාගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුලත් වේ.

නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம்,
கொழும்பு 07, இலங்கை
INDEPENDENCE SQUARE,
COLOMBO 07, SRI LANKA
දුරකථනය / தொலைபேசி / Telephone. 2691151
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

1.3 විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුලත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා තිබි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව විවෘත විශ්වවිද්‍යාලයට ගෙවිය යුතු ශේෂය රු.261,810 ක් වුවද විවෘත විශ්වවිද්‍යාලයීය ගිණුම් අනුව ආයතනයෙන් විශ්වවිද්‍යාලයට ලැබිය යුතු ශේෂය රු.335,526 ක් විය. රු.73,716 ක් වූ ගිණුම් අතර වෙනස සසදා ගිණුම් වලට ගැලපීම් කර නොතිබුණි.

(ආ) 2008 වර්ෂයේ සිට ගිණුම් වල දක්වා තිබූ රු.35,000 ක් වූ යන්ත්‍ර හා උපකරණ පුනරුත්ථාපනය සඳහා වූ වැය නොකල ප්‍රතිපාදනය ගිණුම් වල අවශ්‍ය ගැලපීම් සිදුකිරීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේද ඒ අයුරින්ම පෙන්වා තිබුණි.

2.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම.

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2005 අංක 04 දරන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පශ්චාත් උපාධි ආයතන නියමාවලිය	
12 (3) ඡේදය	2010 වර්ෂයේදී අධ්‍යයන මණ්ඩල රැස්වීම් වාර 03 ක් ගණ පූර්ණය නොමැතිව පවත්වා තිබුණි.
12(4) ඡේදය	අධ්‍යයන මණ්ඩලය එක් වර්ෂයක් තුල වාර 06කට නොඅඩු වාර ගණනක් රැස්විය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදී රැස්වී තිබුනේ වාර 03ක් පමණි.

(ආ) මුදල් රෙගුලාසි

371 (2)

අවස්ථා 07 කදී ලබා දුන් එකතුව රු.80,500 ක් වූ උප අග්‍රිම වලින් රු.50,280 ක් පමණක් අදාල කටයුතු සඳහා වැය කර තිබුණි. අදාල කටයුත්ත සඳහා වූ තථ්‍ය අරමුදල් අවශ්‍යතාවය සැලකිල්ලට නොගෙන උප අග්‍රිම ලබා දී තිබු බව නිරික්ෂණය විය.

2.2.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායක මුදල් ගණනය කිරීමේදී අධ්‍යයන දීමනාව සැලකිල්ලට ගැනීම හේතුවෙන් 2010 වර්ෂය සඳහා දායක මුදල් ගෙවීමේදී රු.16,488 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය සමාලෝචනය

3.1.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ ආයතනයේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රජයේ ප්‍රදාන සැලකිල්ලට ගැනීමට පෙර රු.1,928,183 ක ඌනතාවයක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා අනුරූපී ඌනතාවය රු.2,339,666 ක් විය. පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදාන වශයෙන් ලැබී තිබූ රු.2,478,000 ක් හා පුනරුත්ථාපනය සඳහා ලැබී තිබූ රු. 6,638 ක ප්‍රදාන සැලකිල්ලට ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂයේ ඌනතාවය අඩු වී රු.826,455 ක අතිරික්තයක් පෙන්නුම් කර තිබුණි. ඉකුත් වර්ෂයේ ලැබී තිබූ පුනරාවර්තන වියදම් සඳහා රු.2,018,500ක රජයේ ප්‍රදානය සහ පුනරුත්ථාපනය සඳහා වූ රු.142,705ක රජයේ ප්‍රදානය සැලකිල්ලට ගැනීමෙන් පසු ඌනතාවය රු. 178,461 ක් දක්වා අඩු වී තිබුණි.

3.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

රජයේ පුනරාවර්තන ප්‍රදාන හා රජයේ පුනරුත්ථාපන පුනරාවර්තන ප්‍රදාන ලෙස රු.2,754,638 ක මුදලක් ලැබී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ ආයතනය විසින් දරන ලද මුළු පුනරාවර්තන වියදම රු. 4,097,713 ක් විය.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 අයවැය පාලනය

(අ) සමාලෝචිත වර්ෂයේ ආයතනයේ අයවැය ගත අභ්‍යන්තර ආදායම රු.750,000 ක් වූ අතර තථ්‍ය අභ්‍යන්තර ආදායම රු.1,657,225 ක් විය. අයවැය ගත හා තථ්‍ය ආදායම සැසඳීමේදී ලැබී තිබූ අභ්‍යන්තර ආදායම 121% කින් අයවැය ගත ආදායම ඉක්මවා තිබුණු බව අනාවරණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ ආයතනයේ අයවැය ගත පුනරාවර්ථන වියදම රු.4,823,000 ක් වූ අතර තථ්‍ය පුනරාවර්ථන වියදම රු.3,527,670 ක් විය. ඒ අනුව ඇස්තමේන්තු ගත පුනරාවර්ථන වියදම් වලින් 73% ක් පමණක් වැයකර තිබුණි. වියදම් ශීර්ෂ 05 ක ඉතිරිය 100% ක් වූ අතර වියදම් ශීර්ෂයන් 09 ක ඉතිරිය 50% ඉක්මවා තිබුණි.

(ඇ) ප්‍රාග්ධන වියදම් ලෙස රු.1,000,000 ක මුදලක් රජය විසින් වෙන්කර තිබුණි. මින් ලබාගෙන තිබුණේ රු.300,000 ක් පමණක් වූ අතර එයින් ආයතනය විසින් වැයකර තිබුණේ රු.149,271 ක් පමණි. ගොඩනැගිලි සහ ඉදිකිරීම් සඳහා රු.200,000 ක මුදලක් වෙන්කර තිබුණද ඉන් කිසිදු වියදමක් සමාලෝචිත වර්ෂය තුල දරා නොතිබුණි.

(ඈ) අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර විචලනයන් පැවතිම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

3.2.2 මානව සම්පත් කළමනාකරණය

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු 02 ක් හා ආධුනික කථිකාචාර්ය තනතුරක් සඳහා වූ ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු සමාලෝචිත වර්ෂය තුල පුරවා නොතිබුණි.

3.2.3 සංයුක්ත සැලැස්ම

(අ) 2009 - 2012 කාලපරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලැස්ම වාර්ෂිකව යථාවත් කර නොතිබුණි.

(ආ) ආයතනය පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් ඉඩපහසුකම් එය සතුව නොතිබූ අතර වර්තමානයේ විවෘත විශ්වවිද්‍යාලය සතු ගොඩනැගිල්ලක ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි. කාර්යාල ඉඩපහසුකම් ප්‍රසම්පාදනය කිරීමේ අවශ්‍යතාවය සපුරා ගැනීම පිළිබඳ සංයුක්ත සැලැස්මේ ඇතුලත් කර නොතිබුණි.

(ඇ) සංයුක්ත සැලැස්ම අනුව ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවට සිසුන් බඳවා ගැනීමේ විභාගය 2009 වර්ෂයේ සැලසුම් කල යුතුව තිබූ අතර 2010 වර්ෂයේ සිසුන් බඳවා ගැනීම සිදුකල යුතු විය. එසේ වුවද සමාලෝචිත වර්ෂය තුල ඒ සඳහා කටයුතු කර නොතිබුණි.

3.2.4 ක්‍රියාකාරී සැලැස්ම

ක්‍රියාකාරී සැලැස්මද අවශ්‍යතා වලට අනුකූලව යථාවත් කර නොතිබුණි. 2010 ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාකාරකම් 09 ක් ක්‍රියාත්මක කල යුතු විය. එසේ වුවද සමාලෝචිත වර්ෂය තුල එම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර නොතිබුණි

3.2.5 කාර්ය සාධනය

(අ) ආයතනය ආරම්භ කර වර්ෂ 05 ක කාලපරිච්ඡේදයක් ඉක්මවා ඇතත් මේ දක්වා ලියාපදිංචි වී ඇති මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 100 ක් වන අතර ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම හා ඉංග්‍රීසි අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම ලබා ඇත්තේ එක් ශිෂ්‍යයෙකු පමණකි. එම කාර්යසාධනය රජය විසින් ඒ සඳහා වර්ෂ 05 කට අධික කාලයක් දරන ලද වියදම හා සැසඳිමේදී ප්‍රමාණවත් නොවේ.

(ආ) 2006-2009 වර්ෂ තුල ආයතනයේ සිසුන් 77ක් ලියාපදිංචි වී ඇතත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට අධ්‍යයන කටයුතුවල යෙදී සිටියේ සිසුන් 28 ක් පමණි. ඒ අනුව අධ්‍යයන කටයුතු අතහැර දමා ඇති ශිෂ්‍ය සංඛ්‍යාව 48ක් වැනි ඉහල මට්ටමක විය. එහි ප්‍රතිශතය 62%ක් විය.

4. පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුවේ.

(අ) අත්තිකාරම්.

(ආ) කාර්ය මණ්ඩල බඳවා ගැනීම.

එච්. ඒ.එස්. සමරවීර
වැඩ බලන විගණකාධිපති

10. විගණකාධිපතිවරයාගේ වාර්තාවට පිළිතුරු

Postgraduate Institute of English
The Open University of Sri Lanka
P.O. Box 21
Nawala
Nugegoda

Telephone: 2825805, 2825806, 2881527, 2881532, 2853777
Director: Ext:. 528. Assistant Registrar:: Ext 527

2011 ජුලි 01

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

මහත්මයාණනි,

1978, අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(2) ඡේදය හා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(7) (අ) ඡේදය යටතේ 2010 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඉංග්‍රීසි පශ්චාද් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

මෙය ඉහත කාරණය සම්බන්ධයෙන් ඔබගේ 2011 මැයි 31 දින දරණ ලිපිය සමඟ බැඳේ.

ඉහත සඳහන් ඔබේ වාර්තාවෙන් ඔබ විසින් නඟන ලද කරුණු පිළිබඳ අප විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග පහත සඳහන් කර ඇත.

2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1. ගිණුම්කරණ ඌනතා

(අ) අදාළ ගිණුම් සැසඳී ඇති අතර හඳුනාගන්නා ලද වෙනස්කම් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරී වෙත 2011.02.10 දින වාර්තා කරනු ලැබ ඇත.

(ආ) ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල් සමග පැවති රැස්වීමකට අනුව පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත දන්වනු ලැබ ඇත්තේ සංස්ථාපන සහ යන්ත්‍ර සූත්‍ර ආදිය සඳහා වෙන්කරන ලද රු. 35,000.00 ක මුදල මෙම ආයතනය වෙත ලබා ගතහැකි වන පරිදි මහා භාණ්ඩාගාරයේ තැන්පත් ගිණුමෙහි ගිණුම්ගත කෙරෙන බවය. මේ පිළිබඳව ලිඛිත උපදෙස් අවශ්‍ය කෙරේ.

මේ සම්බන්ධයෙන් ලිඛිත උපදෙස් ලබා ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මගින් අයවැය අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යැවීමට උපදෙස් ලැබිණි. ඒ අනුව 2011.06.13 දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ලිපියක් යවා ඇත.

2.2.2 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

නීති රීති රෙගුලාසි හා
කළමනාකරණ තීරණවලට යොමුව

(අ) 2005 අංක 04 දරණ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතන නියමාවලිය

(i) 12(3) ඡේදය

2005 අංක 04 දරණ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ නියමාවලියෙහි 12(8) ඡේදය අනුව අධ්‍යයන මණ්ඩලයේ හෝ අධ්‍යයන මණ්ඩලවල ගණපූර්ණය එහි සමස්ත සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකි.

එමනිසා, අධ්‍යයන මණ්ඩල රැස්වීම සඳහා නිශ්චිත ගණපූර්ණය 04 කි. එහෙයින් ඔබගේ විගණන විමසුමෙහි සඳහන් පරිදි පවත්වන ලද අධ්‍යයන මණ්ඩල රැස්වීම් සඳහා අදාළ ගණපූර්ණය තිබී ඇත.

නමුත් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ නියමාවලියෙහි ඡේද අංක 12(3) අනුව අධ්‍යයන මණ්ඩලය හෝ අධ්‍යයන මණ්ඩල සඳහා ගණපූර්ණය එහි සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු අවම සංඛ්‍යාව විය යුතුය. මෙහිදී නිලබලයෙන් පත්වන සාමාජිකයින් ගණනය නොකළ යුතුය.

මෙසේ ඉහත නියමාවලියෙහි අංක 12(3) සහ 12(8) යන ඡේදයන්හි ගණපූර්ණය දෙයාකාරයකින් අර්ථකථනය කර ඇති හෙයින් කළමනාකරණ මණ්ඩලය මගින් නියමාවලිය සම්බන්ධයෙන් සංශෝධන සිදුකිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට දැනුම් දෙන ලදී.

(ii) 12(4) ඡේදය

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සතුව සීමිත සම්පත් ප්‍රමාණයක් ඇති හෙයින් සාකච්ඡා කිරීමට තරම් කරුණු නොමැති අවස්ථාවන්හි දී අධ්‍යයන මණ්ඩල රැස්වීම් පවත්වනු ලැබ නැත. එහෙයින් 2010 වර්ෂය තුළ දී අධ්‍යයන මණ්ඩල රැස්වීම් තුනක් පමණක් පවත්වනු ලැබ ඇත. (අධ්‍යයන මණ්ඩලය සාමාජිකයන් දස දෙනෙකුගෙන් සමන්විත වන අතර සෑම සාමාජිකයෙකු සඳහාම රු. 500/- බැගින් රැස්වීමට සහභාගිවීම වෙනුවෙන් ගෙවනු ලැබේ.)

(ආ) මුදල් රෙගුලාසි 371 (2)

උපඅග්‍රිමයන් නිරදේශ කරනු ලබන්නේ ඇස්තමේන්තුගත වියදම් මත පදනම්වය. විමසා ඇති උපඅග්‍රිමයන් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ රැස්වීම්වලට අදාළ වියදම් සඳහා උපඅග්‍රිමයෙන් ලබා ගෙන ඇත. කළමනාකරණ මණ්ඩලය සාමාජිකයින් දස දෙනෙකුගෙන් සමන්විත වන අතර සෑම සාමාජිකයෙකු සඳහාම රැස්වීමට සහභාගිවීම වෙනුවෙන් රු. 1,000.00 ක දීමනාවක් ගෙවිය යුතුය. මීට අමතරව, තේ පැන් සංග්‍රහයක් ද පැවැත්විය යුතුය. ඒ අනුව දීමනා සහ සංග්‍රහ කටයුතු සඳහා ඇස්තමේන්තු සකසා රැස්වීමට සහභාගිවීමට නොහැකි බව දන්වා නොමැති සියලු සාමාජිකයක් වෙනුවෙන් ඔවුන් රැස්වීම සඳහා පැමිණෙතැයි සලකා අදාළ ගෙවීම් සහ සංග්‍රහ පිළියෙල කරනු ලැබේ. පැමිණීම නොදන්වා ඇති අවස්ථාවන්හි දී ඇස්තමේන්තුගත වියදමට වඩා තථ්‍ය වියදම අඩුවනු ඇත. මෙම රැස්වීම්වලින් අනතුරුව ප්‍රමාදයකින් තොරව ඉතිරි මුදල් ආපසු ගිණුම්ගත කරනු ලබන බව මෙහිදී සඳහන් කරනු කැමැත්තෙමි. මෙම උපඅග්‍රිමයන් ලබාගනු ලබන්නේ සියලු සාමාජිකයන් රැස්වීම සඳහා සහභාගි වනු ඇතැයි යන චේතනාවෙනි. වගකිවයුතු ආයතනයක් ලෙස පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට සාමාජිකයන් පැමිණ නොසිටිනු ඇතැයි උපකල්පනය කළ නොහැක.

2.2.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යක්ෂ මහාචාර්ය ආර්. රහීම් මහත්මියගේ අධ්‍යක්ෂ දීමනාව ගණනය කොට ඇත්තේ ඇගේ පත්වීමේ දිනය 2005.07.01 දිනට පළමු දිනයක් වන හෙයිනි. එහෙයින් රු.16,488.00 ක ගෙවීමක් මහාචාර්ය ආර්. රහීම් මහත්මිය වෙනුවෙන් විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සහ පාරිතෝෂික වෙනුවෙන් ගෙවීම සිදු කොට ඇත.

3. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය සමාලෝචනය

3.1.1 මූල්‍ය ප්‍රතිඵල

3.1.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

සමාලෝචිත වර්ෂයේ පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය උපයන ලද ආදායම පහත සඳහන් හේතු මත වැඩි වී ඇත.

(අ) 2010/2011 අධ්‍යයන වර්ෂය සඳහා බඳවාගන්නා ලද නව ශිෂ්‍ය කණ්ඩායම සහ එක් සම්මාන වටිනාකමක් සඳහා වන අගය ඉහළ දැමීම හේතුවෙන් පාඨමාලා ගාස්තු ඉහළ ගොස් ඇත. (රු.18,370/- සිට රු.30,000/- දක්වා)

(ආ) කෙටිකාලීන තැන්පතු සඳහා ලැබුණු පොලියෙන්

3.2. මෙහෙයුම් සමාලෝචනය

3.2.1 අයවැය පාලනය

(අ) සම්මාන වටිනාකමක් සඳහා (per credit) රු. 18,370.00 බැගින් මූලිකව අයවැය ඇස්තමේන්තු කරන ලද අතර එය පසුව රු. 18,320.00 සිට රු. 30,000.00 දක්වා (එක් සම්මාන වටිනාකමක් සඳහා) ඉහළ නංවන ලදී. ඒ අනුව තථ්‍ය අභ්‍යන්තර ආදායම අපේක්ෂිත ආදායම අභිබවා යන ලදී.

(ආ) අදාළ වර්ෂය ඇතුළත ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සිදු කිරීමෙහි අපේක්ෂාවෙන් වර්ෂය මුල දී සැලසුම් සකස් කරන ලදී. නොවැළැක්විය හැකි හේතු මත (පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ පාලනයෙන් තොර) අදාළ වර්ෂය තුළ දී එම බඳවා ගැනීම් සිදු කර ගත නොහැකිවිය. (මෙහි 3.2.2 හි 1 ඡේදය බලන්න.)

(ඇ) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය සඳහා අවශ්‍ය අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගැනීම පමාවීම් හේතුවෙන් (බාහිර පාර්ශ්වයන්ගෙන් සිදුවන ප්‍රමාදයන්) මෙම මුදල භාවිත කිරීමට හැකියාව නොලැබුණි. ඒ හේතුවෙන් උපකරණ සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වෙන් කරන ලද මුදල් භාවිත නොවුණි. රු. 200,000.00 ක මුදල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ප්‍රමාණවත් නොවේ. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය

විසින් මෙම ආයතනය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා වන යෝජනාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත. ඒ සඳහා අනුමැතිය අපේක්ෂා කෙරේ.

(ඇ) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය මේ වන විට ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය (SDC) සමග එකම ගොඩනැගිල්ල හුවමාරු කර ගනිමින් ඉඩකඩ පිළිබඳ ප්‍රශ්නයට මුහුණ දෙමින් සිටියි. එමෙන්ම භෞතික සම්පත්වල අඩුපාඩුකම් ද කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීමේ ප්‍රශ්නයටද මුහුණ දෙයි. මේ හේතුවෙන් අයවැය හා අනෙකුත් අභ්‍යන්තර පාලන පද්ධතිය සතුටුදායක අන්දමින් ක්‍රියාත්මක කළ නොහැකි විය.

3.2.2 මානව සම්පත් කළමනාකරණය

2009 වර්ෂයේ දී අප්‍රේල් මසදී පළ කරන ලද පුවත්පත් දැන්වීමකට අනුව ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර සඳහා ලැබුණු අයදුම්පත් අතරින් එක් අයදුම්කරුවෙකු සුදුසුකම් සපුරා තිබුණි. ඊට අදාළ අනුමැතිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ලිඛිතව විමසන ලද අතර එම අනුමැතිය ලැබුණේ 2010 වසරේ නොවැම්බර් මසදීය. මේ වනවිට විදේශගත වී සිටි අයදුම්කරු අපවෙත දන්වා එවා ඇත්තේ 2010 සැප්තැම්බර් මසදී ඔහුට වැඩභාර ගැනීමට හැකි බවත් එතෙක් ඔහුට නියමිත සම්පූර්ණ කළයුතු වැඩ කොටසක් ඇති බවත්ය. මේ පිළිබඳව කළමනාකරණ මණ්ඩලය විසින් සලකා බලන ලදුව ඔහුගේ පත්වීම ප්‍රමාද කිරීම අනුමත කරන ලදී.

ඉංග්‍රීසි පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර සඳහා සුදුස්සන් තෝරා ගැනීම පිණිස 2011 පෙබරවාරි මසදී අයදුම්පත් කැඳවන ලදී. සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රමවේදය සිදු කෙරෙමින් පවතී. ඉතා ඉක්මනින් සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා කටයුතු යොදනු ලැබේ.

2010 සැප්තැම්බර් මසදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත දන්වනු ලැබ ඇත්තේ ආධුනික කථිකාචාර්ය තනතුර 2010 වර්ෂයේදී අනුමත තනතුරු සම්බන්ධයෙන් අනුමැතිය ලබාදෙන විට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර දක්වා එය පරිවර්තනය කරනු ලබන බවයි. (මෙතෙක් මේ පිළිබඳව ලිඛිතව පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත දන්වනු ලැබ නැත.)

3.2.3 සංයුක්ත සැලැස්ම

(අ) අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හිඟය හේතුවෙන් පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයට සංයුක්ත සැලසුම යථාවත් කිරීමට හැකියාව නොලැබුණි.

(ආ) පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් ලෙස ක්‍රියාත්මක වන අතර ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයේ සහයෝගය මත බොහොමයක් කටයුතු

සිදුකෙරෙන අතර ඉන් වියුක්තව කිරීමේ හැකියාවක් නොමැත. ඒළඟ සංයුක්ත සැලසුමෙහි නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම පිළිබඳ යෝජනාව ඉදිරිපත් කරනු ලැබේ.

(ඇ) පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳව පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අනුමැතිය ලබාගන්නා ලද අතර 2010 නොවැම්බර් මස සිට ඊට අදාළ පියවර ගනිමින් තිබේ. සිසුන් තෝරා ගැනීමේ පරීක්ෂණය 2010 ජුනි මස පවත්වන ලදී.

3.2.4 ක්‍රියාකාරි සැලැස්ම

ක්‍රියාකාරි සැලැස්ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් සිදුවූ ප්‍රමාදයන් හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එක් තනතුරක් සඳහා බඳවා ගැනීම සිදු කෙරුණි. 2009 වර්ෂයේ අප්‍රේල් මසදී තෝරා ගන්නා ලද අයදුම්කරු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය ලැබුණේ 2010 නොවැම්බර් මසදීය. තෝරා ගන්නා ලද අයදුම්කරු පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වැඩබාර ගැනීම ඔහුට සම්පූර්ණ කළ යුතු වැඩ කොටසක් ඇති හෙයින් 2011 සැප්තැම්බර් මසදී සිදුකෙරේ.

(i) එක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරක පුරප්පාඩු පිරවීම සඳහා දැන්වීම පළ කිරීම.
2011 පෙබරවාරි මසදී පුරප්පාඩුව පවතින ඉංග්‍රීසි පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර සඳහා අයදුම්පත් කැඳවන ලදී. ඒ අනුව ඊට අදාළ කටයුතු සිදුකෙරෙමින් පවතී.

(ii) කථිකාචාර්ය (ආධුනික) තනතුර ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර දක්වා පරිවර්තනය කිරීම

2010 වර්ෂයේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත දැනුමදෙනු ලැබ පරිදි කථිකාචාර්ය (ආධුනික) තනතුර අනුමත සේවක සංඛ්‍යාවේ 2010 සංශෝධනය සමඟ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුර දක්වා පරිවර්තනය කරනු ලැබේ. (මෙය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් මෙතෙක් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය වෙත දන්වා එවනු ලැබ නැත.

(iv) (v) සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අනුමැතිය අපේක්ෂිතය.

(vi) සංශෝධිත පාඨමාලා අන්තර්ගතය
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාව
දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති පාඨමාලාවට අයත් දෑ සංශෝධනය කරන ලදී.

(vii) පර්යේෂණ වැඩමුළුමක් මෙහෙයවීම

2011 පෙබරවාරි 25 වන දින පශ්චාත් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේදී පර්යේෂණ වැඩමුළුවක් පවත්වන ලදී.

3.2.5 කාර්යසාධනය

(අ) සහ (ආ) පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳව ශාස්ත්‍රපති පාඨමාලාව දූරස්ථ අධ්‍යාපන වැඩසටහනකි. ලොවපුරා පිහිටි දූරස්ථ අධ්‍යාපන ආයතන මඟින් පවත්වනු ලබන පාඨමාලා සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය සාපේක්ෂ වශයෙන් සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල සමග සසඳා බැලීමේදී අඩු අගයක් පෙන්වයි. ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව දූරස්ථ අධ්‍යාපන වැඩසටහනක් වන හෙයින් ශිෂ්‍යයන් හට පහසු අවස්ථාවක සම්පූර්ණ කිරීමේ නිදහස ඔවුන්ට හිමිවේ.

ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ජ්‍යෝෂ්ඨ ආචාර්යවරු සඳහා සකසා ඇති බව මෙහිලා සඳහන් කළ යුතුය. පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ අධ්‍යාපනය හදාරන සියලු සිසුන් ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකයන්හි ප්‍රධානීන් ලෙස හෝ ජ්‍යෝෂ්ඨ ආචාර්යවරුන් ලෙස හෝ තම ආයතනයන්හි වගකීම් දරමින් සිටී. දූරස්ථ අධ්‍යාපන ක්‍රමය මඟින් මෙම පාඨමාලා සම්පූර්ණ කිරිම පිළිබඳව නම්‍යශීලී පිළිවෙතක් අනුගමනය කරනු ලබන හෙයින් මෙම ශිෂ්‍යයන් වැඩි කාලයක් ප්‍රයෝජනයට ගනිමින් මේවා සම්පූර්ණ කිරිම සිදුකෙරෙයි. ඒ අනුව විශ්වවිද්‍යාල පද්ධතියේ හෝ පාසැල්වල සිටින පශ්චාද් උපාධි ශිෂ්‍යයන් පීඩනයකට හසු නොවනු ඇත.

ඒ අනුව පස්වන ශිෂ්‍ය කණ්ඩායමට අයත් සිසුන් විසින් පළමු වසර දෙකට අයත් පාඨමාලා කොටස (ඒකක නවය) පළමු වසර දෙක තුළ නිමකොට ඇත. එමෙන්ම ඔවුන්ගේ ස්වාධීන නිබන්ධනයට අදාළ වැඩකටයුතු ද අරභා ඇත. දූරස්ථ අධ්‍යාපන ක්‍රමයට අනුව බලන කල මෙම ප්‍රතිශතය සැලකිය හැකි ඉහළ අගයකි.

අවාසනාවකට මෙන් සිදුවන ජාතිවාදී අර්බුද සහ ආතතිය හේතුවෙන් සිසුන් දෙදෙනෙක් රට හැර ගොස් ඇත.

මේ වනවිට තවත් ශිෂ්‍යයන් අට දෙනෙක් ඔවුන්ගේ ස්වාධීන නිබන්ධනයන්ට අදාළ වැඩකටයුතු අරඹා ඇත. ඒ අනුව 2011 වසර තුළ දී ඒවා නිම කිරීමට පුළුවන. 2011 ජූනි මස වන විට ශිෂ්‍යයන් අට දෙනෙකු ඔවුන්ගේ ස්වාධීන නිබන්ධනයන් බාර දෙනු ලැබ ඇත. තවදුරටත් පෙන්වා දිය හැකි තත්ත්වය නම් පූර්ණ කාලීන පහසුකම් සහිත ජාතික විශ්වවිද්‍යාලයක වුවද වසර 15 වැනි කාලයක් මුළුල්ලේ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි සහ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ශාස්ත්‍රපති උපාධි සම්පූර්ණ කරනු ලබන සිසුන් 10 කට පමණ සීමා වන බවයි. ඒ අනුව පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය ස්ථිර ආචාර්ය මණ්ඩලයක් ද නොමැතිව මෙම තත්ත්වය අභිබවා ගොස් වසර 04 වැනි කාලයක් තුළ දී ස්වාධීන නිබන්ධන සම්පූර්ණ කරනු ලබන සිසුන් දස දෙනෙකු බිහිකිරීමට සමත්වී ඇත.

ශිෂ්‍ය සංඛ්‍යාව වර්ධනය කරලීමේ අරමුණින් පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය 2009 වර්ෂයේ දී දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ පශ්චාද් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් අනුමැතිය ඉල්ලන ලදුව 2010 ඔක්තෝම්බර් මස 17 දින ඊට අදාළ අනුමැතිය ලබා ගන්නා ලදී. පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව ශාස්ත්‍රපති උපාධිය සඳහා සිසුන්ට යම් උපකාරයක් වන අතර එය පාඨමාලාව අතරමග හැරදමා යන සිසුන්ගේ ප්‍රශ්නයට ද පිළිතුරක් වනු ඇත.

පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනයේ වියදම මධ්‍යස්ථ වේ. 2006-2010 දක්වා කාලය සඳහා මෙම ආයතනයේ වියදම රුපියල් මිලියන 10.7 කි. ඒ අනුව එක් වසරක් සඳහා දළ වියදම රුපියල් මිලියන 2.1 කි.

4. පද්ධති හා පාලන

(අ) අත්තිකාරම්
කරුණාකර ඉහත 2.2.3 ඡේදයේ (ආ) පිළිතුර බලන්න.

(ආ) කාර්ය මණ්ඩල බඳවා ගැනීම්
කරුණාකර ඉහත 3.2.2 ඡේදයේ පිළිතුර බලන්න.

මහාචාර්ය ආර්. රහීම්
අධ්‍යක්ෂ/පශ්චාද් උපාධි ඉංග්‍රීසි භාෂා ආයතනය